# දළදා සිරිතෙහි වෘත්තගන්ධිය රීතියක් ද ශෛලියක්ද?

ඒන්ජල් කොටවලගෙදර[1]

බෞද්ධ ජනතාවගේ අතිපූජනීය වස්තුවක් වූ දළදා වහන්සේ උදෙසා අතීතයේ සිට ම ග්‍රන්ථ සම්පාදනය සිදු වී ඇත. කුරුණෑගල යුගයේ දෙවන පණ්ඩිත පරාක්‍රමබාහු රජු දවස 'දෙව්රද දම්පසඟිනා' යයි විරුද නම් ලත් කතුවරයකු විසින් ලියන ලද දළදා සිරිත නම් ග්‍රන්ථය ඒ අතර සුවිශේෂි කෘතියකි.

සිංහල ගද්‍ය සාහිත්‍යාවලියෙහි මෙය සුවිශේෂී තැනක් ගැනීමට වෙසෙසින් හේතු සාධක වී ඇත්තේ කෘතියෙහි උපයුක්ත භාෂා ලක්ෂණයි. සමස්ත කෘතිය පුරා වෘත්තයක සුවඳ වහනය වන වෘත්තගන්ධී රීතිය විහිද යන ආකාරය දක්නට හැකි ය. දළදා සිරිතෙහි උපයුක්ත භාෂා ලක්ෂණ පිළිබඳ විමසීම් කරන සමහර විද්වතුන් මේ වෘත්තගන්ධිය පැහැදිලි රීතියක් ලෙස හඳුනා ගත් බවක් නො පෙනේ. 'වෘත්තගන්ධිය' ශෛලියක් ලෙස ව්‍යවහාර කළ අවස්ථා අපට හමුවේ. එක ම විචාරකයකු තවත් වරක් ශෛලියක් ලෙසත් තවත් වරක් රීතියක් ලෙසත් මෙය හඳුන්වා දුන් අවස්ථා අපට හමුවේ.

සැබවින් ම 'රීතිය' හා 'ශෛලිය' යන සංකල්ප දෙකෙහි සියුම් වෙනසක් පවතී. මෙය එකක් ලෙස සලකා ව්‍යවහාර කිරීම විද්‍යාර්ථීන් ව්‍යාකූලතාවට පත්කරවන්නකි. භාෂාව පිළිබඳ මෙවැනි ගැටළු සහගත තත්ත්වයන් තිබීම ආධුනික පාඨකයා අපහසුතාවට පත්කරවයි. මේ කරුණ දළදා සිරිතට පමණක් නොව සෑම කෘතියකට ම අදාළ වෙයි.

කරුණු මෙසේ හෙයින් දළදා සිරිත කෘතියෙහි එන වෘත්තගන්ධිය පිළිබඳ ප්‍රකාශ වී ඇති විද්වත් මත පරීක්ෂා කරමින් ඒවායෙහි සත්‍යාසත්‍යතාව විභාග කිරීම මේ ලිපියේ අරමුණ වන්නේ ය. මෙහි දී 'ශෛලිය' හා 'රීතිය' යන සංකල්ප දෙකෙහි පවත්නා සියුම් වෙනස පිළිබඳ පැහැදිලි කිරීමක් මූලික වශයෙන් සිදු කෙරේ.

---

1 සිංහල අධ්‍යයන අංශය, රුහුණ විශ්වවිද්‍යාලය, මාතර
ඊමේල්: angel.kotawalagedara@yahoo.com

අනතුරුව පුරාණාචාර්යවරුන් විසින් වෘත්තගන්ධිය ප්‍රධාන ගද්‍ය රීතියක් ලෙස දක්වන ලද ආකාරය පැහැදිලි කිරීමක් සිදුවේ. ඒ අනුව වෘත්තගන්ධිය පැහැදිලි ව ම රීතියක් ලෙස පිළිගත යුතු බව අවධාරණය කෙරේ. ඉන්පසු දළදා සිරිත කතුවරයා මේ රීතිය අඛණ්ඩ ව ආරක්ෂා කළ ආකාරය සනිදර්ශන ව පැහැදිලි කිරීමක් සිදු කෙරෙන අතර අවස්ථාවෝචිත ව ශෛලිය වෙනස් කොට ඇති ආකාරය පැහැදිලි කිරීමක් සිදු වේ.

කිසියම් ලේඛකයකු අවස්ථාවෝචිත ව විවිධ ශෛලී අනුගමනය කළ ද ඔහුට ම ආවේණික වූ එක්තරා සම්ප්‍රදායක්, ආකාරයක් හෙවත් රටාවක් පවත්නා බව හඳුනා ගත හැකි ය. කතුවරයාගේ විවිධ මනෝභාවයන් අනුව විවිධ ශෛලි අනුගමනය කළ ද ඒ සෑම ශෛලියක් යටින් ම රන්හුයක් ලෙසින් දිවෙන ඒකාකාරී ස්වරූපය රීතියයි.

කරුණු මෙසේ වන හෙයින් දළදා සිරිතෙහි එන වෘත්තගන්ධි ලක්ෂණය ශෛලියක් නොව රීතියක් බව පිළිගැන්ම වඩාත් සාධාරණ බව පැහැදිලි වේ.